#  ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 2005/14 - 2017 පෙබරවාරි මස 08 වැනි බදාදා - 2017.02.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මෙම නියමය මගින්, (2017 ජනවාරි 18 වැනි දින අංක 2002/32 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් අවසන්වරට සංශෝධිත) ඒකී පනතේ 139 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර එහි 21 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු වූ, ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, 2006 ජූනි 09 වැනි දින අංක 1448/27 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ දැක්වෙන ''වෛද්‍ය පීඨය'' යන අයිතමයට අනුරූපවන්නා වූ උපලේඛනයේ II වැනි තීරයේ දැක්වෙන ''13. මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය'' යන සටහන වෙනුවට පහත දැක්වෙන සටහන ආදේශ කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''13. මනෝ වෛද්‍ය අධ්‍යයන අංශය''.

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2017 ජනවාරි මස 25 වැනි දින.
කොළඹ දී ය.

02 - 859


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*